## ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම 2008 වසර ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම්පත් කැඳවයි.

අ:පො:ස (සා:පෙ) 2007 දෙසැම්බර් විභාගයට පළමු වරට පෙනී සිට, අවම වශයෙන් ප්‍රධාන විෂයයන් 8 කට **A** සාමාර්ථ ලබා ඇති, අඩු ආදායම් ලාභී පවුල් වල දරු දැරියනට මෙම ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කළ හැක. සියලුම අයදුම් කරුවන් තම අ:පො:ස (සා:පෙ) ප්‍රථිඵල විද්‍යුහල්පති මගින් සහතික කරවා, පවුලේ සාමාජික සංඛ්‍යාව සහ ඔවුන් නිරත කාර්යයන් පිළිබඳ විස්තර ඇතුළුව **පවුලේ මාසික ආදායම** පැහැදිලිව සංඛ්‍යාත්මක වශයෙන් සටහන් කොට **ඒ සැම** ග්‍රාම සේවක මගින් සහතික කරවා එවිය යුතුය.

සියළුම ඉල්ලුම්පත් **ඉල්ලුම්කරු විසින්ම සකස්කර ගත යුතුය.** සම්පුර්ණ නම, ලිපිනය, උපන් දිනය, හැඳුනුම්පත් අංකය, ස්ත්‍රි පුරුෂ භාවය, අ:පො:ස (සා:පෙ) 2007 විභාග අංකය සහ ප්‍රථිඵල (විද්‍යුහල්පති සහතික කල යුතුයි), පාසල, පවුලේ සියළු විස්තර, සංඛ්‍යාත්මක වශයෙන් පවුලේ මාසික ආදායම (ග්‍රාම සේවක සහතික කල යුතුයි), ඉල්ලුම්කරුගේ අත්සන සහ දිනය පැහැදිලි ලෙස අඩංගු විය යුතුය.

ඉල්ලුම්පත් 2008-06-17 දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය. ඉල්ලුම්පත් කැනඩාවට ලැබීමට සති 2 ක පමණ කාලයක් ගතවිය හැකි බැවින්, මැයි මස 31 ට පලමුව තැපැල් කල යුතුය.

Dr. Bandula Abeysundara
Secretary, Sri Lanka – Canada Scholarship Foundation
1406 Garibaldi Place
Coquitlam, BC
V3E 2S6
CANADA

අවම 8 **A** නැති, අසම්පුර්ණ සහ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ. ඉල්ලුම්පත් වල ඇති සියළුම කරුණු පෞද්ගලිකව සොයා බැලේ. **එම තොරතුරු කිසිවක් අසත්‍ය බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අත්සිටු වීමේ අයිතිය අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.** තෝරාගනු ලැබු ශිෂ්‍යත්වලාභීන්ට පමණක් පෞද්ගලිකව දැනුම් දෙනු ඇත. එම සිසුනට අ:පො:ස (උ:පෙ) 2010 විභාගය දක්වා මාසිකව රුපියල් 1000/= බැගින් මුදල් ආධාර සැපයෙනු ඇත.